ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

රියදුරු/කොන්දොස්තර (කාන්තා/පිරිමි) තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

යහපත්, ගුණාත්මක ප්‍රවාහන සේවයක සාඩම්බර කොටස්කරුවෙකු වීම සඳහා අප හා එක්වන්න.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය දිවයින පුරා විසිරී පවතින ඩිපෝ 107ක් හා ඊට සම්බන්ධිත ප්‍රාදේශීය ධුරාවලියට, රියදුරු පාසල් වලින් සමන්විත, 25000කට වැඩි සේවක සංඛ්‍යාවක් සේවය කරන රටේ මගී ප්‍රවාහන ආයතනයක් වන අප ආයතනයේ සියලුම ප්‍රාදේශීයකරණයට අදාළ විශේෂිත පුරප්පාඩු පවතින රියදුරු හා කොන්දොස්තර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම්වලින් යුතු අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩුව පවතින තනතුරු

තනතුර	පිරිමි	කාන්තා
රියදුරු	425	25
කොන්දොස්තර	275	25

01. රියදුරු තනතුර (කොන්ත්‍රාත්)

අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

i. අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් 06 ක් සම්මත සාමාර්ථ 02 ක් සමග සමත්වීම (දෙවරකට නොවැඩි වාර ගණනකදී)

ii. වයස අවුරුදු 21-45 අතර වීම

iii. අවුරුදු 03 කට වැඩි පළපුරුදු බර වාහන බලපත්‍රයක් පැවතීම

iv. අවම බර කි.ග්‍රෑ. 45 ක් වීම

v. උස අඩි 5

vi. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම.

vii. පිළිගත් ආයතනයක බාහිර (මගී ප්‍රවාහන විශේෂයි) රියදුරෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

02. කොන්දොස්තර තනතුර (කොන්ත්‍රාත්)

අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

i. අ.පො.ස. (සා/පෙළ) විභාගය ගණිතය හා මව් භාෂාව ඇතුළුව විෂයයන් 06 ක් සම්මත සාමාර්ථ 02 ක් සමග සමත්වීම. (දෙවරකට නොවැඩි වාර ගණනකදී)

ii. වයස අවුරුදු 18-45 අතර වීම.

iii. අවම බර කි.ග්‍රෑ. 41 ක් වීම.

iv. උස අඩි 5

v. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම.

vi. කොන්දොස්තර මගී ප්‍රවාහන බලපත්‍රයක් පැවතීම විශේෂ සුදුසුකමකි.

පොදු කොන්දේසි හා ලබාදෙනු ලබන පහසුකම්

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 08% වන අතර සේවායෝජකයා විසින් 12% ක් දායකත්වය දරනු ඇත. සේවක භාරකාර අරමුදල සඳහා සේවායෝජකයා විසින් 03% ක දායකත්වයක් ලබාදේ.
- මාසිකව මූලික කොන්ත්‍රාත් දීමනාව

  රියදුරු - රු. 38,387/-

  කොන්දොස්තර - රු. 37,715/-

රියදුරු හා කොන්දොස්තර තනතුරු සඳහා ඉහත මූලික කොන්ත්‍රාත් දීමනාවට අමතරව

- ➢ ජීවන වියදම් දීමනාව රු. 17,800/-
- ➢ අතිකාල දීමනා
- ➢ දිරි දීමනා

ගෙවනු ලැබේ.

- බඳවා ගැනීමෙන් පසුව කාර්ය වාර්තා පදනම මත සේවයේ යෙදේ.
- රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා ශ්‍රීලංගම විසින් ලබා දෙනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රතිඵල අනුව මණ්ඩලීය තීරණයක් මත සිදු කෙරේ.
- කොන්දොස්තර තනතුරු සඳහා බඳවා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් පසුව ශ්‍රීලංගම විසින් ලබා දෙනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රතිඵල අනුව මණ්ඩලීය තීරණයක් මත සිදු කෙරේ.
- බඳවා ගැනීමෙන් පසුව සේවා ස්ථානය සඳහා යාමට හා එමට කිලෝ මීටර් 30ක් ඇතුළත ගමන් අවස්ථා පහසුකම් ලබා දෙනු ලැබේ.

ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට කැමති අයදුම්කරුවන් පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් **"ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025-07-31 දිනට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. ලිපිය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් අයදුම් කරන තනතුර හා පළාත සඳහන් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී පාසල් හැසිරීම් සහතිකය (ශිෂ්‍ය චරිත වාර්තාව) හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට, කොළඹ 05.

අයදුම් කරන තනතුර ....

කාන්තා ☐ පිරිමි ☐

1. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම ....

   (ආ) මුලකුරු සමග නම :- ....

2. ලිපිනය :- ....

3. i. උපන් දිනය :- ....

   ii. 2025-07-31 දිනට වයස

   අවුරුදු ...... මාස ...... දින ......

4. ජාතික හැඳුනුම්පත් අංකය :- ....

5. ආගම :- ....

6. ජාතිය :- ....

7. i. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද යන වග :- ....

   ii. එසේ නම් ලියා පදිංචියෙන්ද පරම්පරාවෙන්ද යන වග :- ....

8. පළාත :- .... දිස්ත්‍රික්කය :- ....

   ආසන්නතම ශ්‍රීලංගම ඩිපෝව : ....

9. අධ්‍යාපන සුදුසුකම්

   i. අ.පො.ස. (සා/පෙළ)

   වර්ෂය : ....

   විභාග අංකය : ....

	විෂයය	සාමාර්ථය

අ.පො.ස. (උ/පෙළ)

වර්ෂය : ....

විභාග අංකය : ....

	විෂයය	සාමාර්ථය

10. බර (කිලෝ) :- ....

11. උස අඩි :- .... අඟල් :- ....

12. දුරකථන අංකය නිවස :- .... ජංගම :- ....

13. i. රියදුරු බලපත්‍ර අංකය (අදාළවේ නම් පමණි) :- ....

    ii. බලපත්‍ර කාණ්ඩය :- ....

    iii. වලංගු කාලය :- ....

14. i. කොන්දොස්තර බලපත්‍ර අංකය (අදාළවේ නම් පමණි) :- ....

    ii. නිකුත් කළ ආයතනය :- ....

15. i. මීට ඉහතදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කර ඇත්ද? :- ....

    ii. එසේනම් සේවය අවසන් වීම පිළිබඳ කෙටියෙන් විස්තර කර සඳහන් කරන්න.

    ....

16. i. මීට ඉහතදී උසාවියකින් ඔබ වරදකරු වී තිබේද? :- ....

    ii. එසේනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න :- ....

ඉහත සඳහන් විස්තර මාගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික වන අතර අසත්‍ය තොරතුරක් සපයා ඇතහොත් ඒ සම්බන්ධව මණ්ඩලය ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවද සහතික වෙමි.

දිනය : ....

අයදුම්කරුගේ අත්සන